සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 06 - 2023**

# නර්තනය

**පැය 1. වි. 30**

නම / විභාග අංකයඃ

## I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 06 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. නර්තනයේ මූලික ඉරියව්ව ................................................ නමින් හැඳින්වේ.
    (i) දණ්ඩියම (ii) මණ්ඩිය
    (iii) කස්තිරම (iv) ගී මණ්ඩිය

02. ''කුද ගත ගත දොම්'' බෙර පදය යොදා ගනු ලබන්නේ ................................................ වන්නම සඳහාය.
    (i) තුරගා (ii) වෛරෝඩි
    (iii) හනුමා (iv) සිංහ රාජ

03. ඉද්ද, සමන්, පිච්ච, කැකුළු යන පද ප්‍රස්ථාර කළ හැකි තාල රූපය නම් ................................................
    (i) මාත්‍රා 2+2 තාල රූපයයි (ii) මාත්‍රා 4+4 තාල රූපයයි
    (iii) මාත්‍රා 2+3 තාල රූපයයි (iv) මාත්‍රා 3+3 තාල රූපයයි

04. නර්තනයේ දී වැලමිට, උරබාහු, බෙල්ල, දණහිස යන ශාරීරික කොටස් යොදා ගනු ලබන්නේ ................................. කොටසයි.
    (i) ප්‍රත්‍යංග (ii) උපාංග
    (iii) අංග (iv) අංග හා උපාංග

05. ''පාන්දරින් ස්කෝලෙට ටැංටු කරත්තෙන්'' යන ගීතය සඳහා සංගීත නිර්මාණ කරනු ලැබුවේ .......................................... මහතාය.
    (i) සෝමතිලක දිසානායක (ii) සුනිල් දයානන්ද කෝනාර
    (iii) සුනිල් ආරියරත්න (iv) හර්ෂණ දිසානායක

06. ................................................... උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,
    (i) සව්රිස් සිල්වා මහතා (ii) සිරිබෝහාමි මහතා
    (iii) හීන් නිලමේ ගුරුතුමා (iv) නිත්තවෙල ගුණයා මහතා

- අංක 07-10 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතුර ප්‍රහේලිකාව තුළ ලියන්න.

පහලට

07. උද්‍යාන පරිසරයේ සුන්දරත්වය දැකීමෙන් සිතේ පහළවන භාවයකි.
08. පිඹීමෙන් හඬ උපදවා ගැනීමට සකස් කර ගන්නා විකල්ප වාද්‍ය උපකරණයකි.

හරහට

09. පරිසරයේ මල්ගොමු අතර පියඹා යන සත්වයකි.
10. හනුමා වන්නමෙන් වර්ණනා කෙරෙණ සත්වයා මේ නමින් හැඳින්වේ.

| | | | | |
|---|---|---|---|---|
| 9 ස 7 | | 8 න | | |
| | ■ | | ■ | ■ |
| | ■ | 10 ව | | |

**● ප්‍රශ්න අංක 11-15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසට ගැලපෙන පිළිතුරු B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | සෙම්බු නර්තනය | කැරොල් ගීත |
| 12. | ගැට බෙරය | සබරගමු |
| 13. | තෙයිකිට තෙයි තාම් | කළගෙඩිය |
| 14. | මහ බඹා කෝලම | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ |
| 15. | නත්තල් උත්සවය | පා සරඹ |

**● අංක 16-20 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා හිස් තැන් මත ලියන්න.**

16. නර්තනයට අවශ්‍ය ඉරියව් (හැඩතල) නිවැරදි කර ගැනීම සඳහා ........................................... කිරීම වැදගත් වේ.
17. තාල තැබීම ........................................... තැබීම යනුවෙන්ද හැඳින්වේ.
18. වෙස් ඇඳුම් කට්ටලය භාවිතා කරනු ලබන්නේ ........................................... නර්තන සම්ප්‍රදායේය.
19. සමන් දේවාල පෙරහැර උත්සවය නිමා කරනු ලබන්නේ ........................................... නැටීමෙනි.
20. තෛපොංගල් උත්සවය ........................................... පූජෝපහාර සඳහා පැවැත්වේ.

(හිරු දෙවියන්ට, නම්‍යතා අභ්‍යාස, ගරායකුම, උඩරට, අසාතය)

# නර්තනය - 6 ශ්‍රේණිය

**II කොටස**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. **ඔබ පංති කාමරයේ දී ගොඩ නගා ගත් ලී කෙළි හෝ කළ ගෙඩි නර්තන කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) ලී කෙළි / කළ කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා යොදාගත් කවියක් ලියන්න. (ල. 2)

(ii) එම ක්‍රියාකාරකම සඳහා භාවිතා කළ රංග උපකරණය ලියන්න. (ල. 2)

(iii) සිංහල ලී කෙළි හා කළ යන ගැමි නැටුම් අංග දෙකට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් අංග දෙක ලියන්න.

ලී කෙළි .........................................................

කළ .........................................................  (ල. 2)

(iv) ඔබ කණ්ඩායම් නර්තනයෙන් අත්පත් කරගත් යහපත් ගුණාංග 02 ක් ලියන්න. (ල. 4)


02. (i) තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ල. 3)

(ii) මාත්‍රා 2+2 තාල රූපයට රබන් පදයක් ලියා දක්වන්න. (ල. 3)

(iii) ''එක පඳුරෙන් ලී සයක් කපාගෙන'' යන කවි පදය නිවැරදි තාල රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 4)

03. **පහත සඳහන් රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A



B



C



(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කරන්න. (ල. 3)

(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කරන්න. (ල. 3)

(iii) C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 4)

04. (i) පහත නම්කර ඇති නර්තන ශිල්පීන් තිදෙනා අයත්වන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

1. එච්. එස්. සව්රිස් සිල්වා මහතා
2. එන්. එස්. සිරිබෝහාමි මහතා
3. නිත්තවෙල ගුණයා ගුරුන්නාන්සේ (ල. 3)

(ii) ඉහත සඳහන් ඔබ කැමති නර්තන ශිල්පියෙක් තෝරාගෙන ඔහු විසින් නර්තන කලාව සඳහා ඉටුකළ සේවාවන් ලියා දක්වන්න. (ල. 3)

(iii) දේශීය නර්තන සම්ප්‍රදායන් සුරැකීම සඳහා ඔබ කරන යෝජනා 2 ක් ලියන්න. (ල. 4)

(4) WWW.PastPapers.WiKi (3)



Download Term Test Papers, Short Notes From One Place!

05. ● පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු වගුව ඇසුරින් සම්පූර්ණ කරන්න.

● හිස්තැන්වලට අදාල නිවැරදි පිළිතුර ලියන්න.

| ආගමික උත්සවය | පැවැත්වීමේ හේතුව නම් කරන්න | යොදාගත් සැරසිල්ලක් නම් කරන්න | උත්සවය හා බැඳි සාරධර්මයක් නම් කරන්න |
|---|---|---|---|
| තෛයිපොංගල් උත්සවය | i ........................................ | iii ........................................ | සූර්යයාට කළගුණ දැක්වීම |
| වෙසක් උත්සවය | ii ........................................ | වෙසක් කූඩු සැරසීම | v ........................................ |
| නත්තල් උත්සවය | කිතුනු උපත සිහි කිරීම | iv ........................................ | අසරණ අයට තෑගි භෝග ලබා දීම |

(ල. 2×5=10)

PAST PAPERS WIKI

(4) WWW.PastPapers.WiKi (4)



Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## නර්තනය

පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. (ii) | පහලට | 11. කළගෙඩිය | 16. නමස්කාර අභ්‍යාස |
| 02. (iii) | 07. සතුට | 12. සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ | 17. ආඝාතය |
| 03. (iv) | 08. නලාව | 13. පා සරඹ | 18. උඩරට |
| 04. (i) | හරහට | 14. සබරගමු | 19. ගරායකුම |
| 05. (ii) | 09. සමනළයා | 15. කැරොල් ගීත | 20. හිරු දෙවියන්ට |
| 06. (iv) | 10. වඳුරා | | (ල. 2×20=40) |

### II කොටස

01. (i) ලී / කළ වලට අදාලව කවියක් ලියා ඇත්නම් (ල. 02)

(ii) රංග උපකරණය නම් කිරීම (ල. 02)

(iii) ලී කෙලි = කෝලාට්ටම්

කළ = වෙම්බු / සෙම්බු (ල. 02)

(iv) එකමුතු කම, නායකත්වය, කණ්ඩායම් හැඟීම, සමගිය, සහජීවනය ආදි වශයෙන් කරුණු 2 ක් සඳහන් කිරීම (ල. 04)

02. (i) සුළු තනිතිත, මැදුම් තනිතිත, මහතනිතිත (ල. 03)

(ii) මාත්‍රා 2+2 තාල රූපයට ගැලපෙන රබන් පදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii)

| / | | / | | / | | / | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| එ | ක | ප | ඳු | රෙන් | - | ලී | - |
| ස | යක් | - | ක | පා | - | ගෙ | න |

ප්‍රස්තාර සලකුණු යෙදීම (ල. 02)

කවිය ප්‍රස්තාර කිරීම (ල. 02)

03. (i) A පහතරට නර්තන සම්ප්‍රදාය (ල. 3)

(ii) B දවුල (ල. 3)

(iii) C • නර්තන සම්ප්‍රදාය නම් කිරීමට (ල. 1)

• ප්‍රචලිත ප්‍රදේශ, වාද්‍ය භාණ්ඩය, රංග වස්ත්‍රාභරණ, අංගහාර, ශාන්ති කර්මය ආදි වශයෙන් කරුණු 03 ක් ඉදිරිපත් කිරීමට (ල. 3)

(2) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

04. (i) 1. පහතරට නර්තන සම්ප්‍රදාය
2. සබරගමු නර්තන සම්ප්‍රදාය
3. උඩරට නර්තන සම්ප්‍රදාය ආදි වශයෙන් නම් කිරීමට (ල. 03)

(ii) ඉටු කළ සේවාවන් 03ක් ලියා ඇත්නම් (ල. 03)

(iii) නර්තන සම්ප්‍රදායේ සංරක්ෂණය සඳහා ඉදිරිපත් කර ඇති යෝජනා ඊට අදාල නම් කරුණු දෙකකට ලකුණු (ල. 04)

05. (i) හිරු දෙවියන්ට කළ ගුණ දැක්වීම
ගවයාට කළ ගුණ දැක්වීම ආදි වශයෙන් ලියා ඇත්නම් (ල. 02)

(ii) බුදුරජාණන් වහන්සේගේ උපත, බුදුවීම, පිරිනිවන් පෑම යන තෙමගුල සිහි කිරීම (ල. 02)

(iii) කෝළම් සැරසිලි, පුන්කලස්, ගවයා සැරසීමට ආදි වශයෙන් එක් සැරසිල්ලක් දක්වා ඇත්නම් (ල. 02)

(iv) නත්තල් ගස, ගවලෙන, නත්තල් කාඩ් පත් ආදි වශයෙන් සැරසිලි අංගයක් නම් කර ඇත්නම් (ල. 02)

(v) දන්සැල් දීම, උපාසක දාන දීම, වැඩිහිටි නිවාසවලට දාන දීම, අසරණ අයට තෑගි භෝග දීම ආදි පුණ්‍ය ක්‍රියා 01 සඳහන් කර ඇත්නම් (ල. 02)

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**